## පන්විල ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 16 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2011 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 17 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පන්විල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිපල සත්‍ය හා සාධාරන ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුල සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 36 ක වටිනාකම තක්සෙරු කර ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 15,458,909 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 377,301 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මව ආදායම රු. 1,102,479 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 1,616 | 1,419 | 562 |
| (ii) බදු කුලී | 947 | 824 | 163 |
| (iii)බලපත්‍ර ගාස්තු | 625 | 747 | 65 |
| (iv)වෙනත් ආදායම් | 11,223 | 9,382 | 273 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 216,385 |
| (ii) මුද්දර ගාස්තු | 384,840 |

2.2.3 ජල ගාස්තු

2011 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තුව රු.51,733 ක් සම්බන්ධයෙන් ජල සැපයුම් සඳහා වූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 කඩ කුලි

2011 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලි රු.115,853 ක් ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 02 ක කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.79,651 ක් විය.

2.2.5 පරිසර බලපත්‍ර ගාස්තු

(i) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද 2008 ජනවාරි 15 දිනැති අංක 1523/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පරිසර බලපත්‍ර රු.20,000 ක හිඟයක් පැවතුණි.

(ii) පරිසර ආරක්ෂණ බලපත්‍ර කාලය දීර්ඝකර නොගත්, සහ අළුතෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු, ව්‍යාපාර ස්ථාන පිළිබඳව පරිසර නිලධාරි විසින් පරීක්ෂාකර බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණ අතර, 2012 මාර්තු 14 දිනට පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ස්ථාන 57 ක් පැවති බව නිරීක්ෂණය විය.

2.2.6 ගොඩනැගිලි කුලී

සභා ගොඩනැගිල්ලේ පහත මාලය 2009 ඔක්තෝබර් 01 දින සිට වසර 02 ක් වෙනුවෙන් මහජන බැංකුව සඳහා ගිවිසුමක් මත බදු දී තිබු නමුත් මාස තුනක බඳු කුලී වශයෙන් රු.61,500 ක තැන්පතු මුදලක් ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් ලබා ගෙන නොතිබුණි.

2.2.7 වරිපනම් බදු, අක්කර බදු, බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතුව තිබු වරිපනම් බදු රු.125,182 ක්, අක්කර බදු රු.39,695 ක් සහ බලපත්‍ර ගාස්තු රු.23,324 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1), 159 (1) සහ 132 (4) වගන්ති වල විධිවිධාන ප්‍රකාරව අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3 නිශ්ක්‍රිය භෞතික සම්පත්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග වශයෙන් සභාවට ලැබි තිබු අංක WPMM - 9795 දරන යතුරු පැදියේ වාහන හැඳුනුම්පත නැතිවීම හේතුවෙන් එම වාහනයේ ආදායම් බලපත්‍රය ලබාගැනිමට නොහැකිවීම මත 2007 වර්ෂයේ සිට සභාවේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) කසළ කළමනාකරණය සඳහා අංක WP-2808 දරන අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය 2008 වර්ෂයේ පලාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය විසින් ප්‍රාදේශිය සභාවට ලබා දී තිබුණද වසර 4 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝනයට නොගෙන සභා භුමියේ ගාල් කර තිබුණි.

2.4 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව 1,398,214 විය.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය.
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) තොග පාලනය
(ඊ) ණයහිමි හා ණයගැති පාලනය